# සත්තමො පාඨො

භූතපුබ්බං භික්ඛවෙ, ඉමිස්සායෙව සාවත්ථියා වෙදෙහිකා නාම ගහපතානී අහොසි. වෙදෙහිකාය භික්ඛවෙ ගහපතානියා එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: සොරතා වෙදෙහිකා ගහපතානි, නිවාතා වෙදෙහිකා ගහපතානි, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. වෙදෙහිකාය ඛො පන භික්ඛවෙ ගහපතානියා කාළී නාම දාසී අහොසි, දක්ඛා අනලසා සුසංවිහිතකම්මන්තා. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: මය්හං ඛො අය්‍යාය එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: සොරතා වෙදෙහිකාය ගහපතානී, නිවාතා වෙදෙහිකා ගහපතානී, උපසන්තා වෙදෙහිකා ගහපතානීති. කින්නු ඛො මෙ අය්‍යා සන්තංයෙව නු ඛො අජ්ඣත්තං කොපං න පාතුකරොති? උදාහු අසන්තං? උදාහු මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති? නො අසන්තං? යන්නූනාහං අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවා උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානී කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. කිං අය්‍යෙති? කිං ජෙ දිවා උට්ඨාසීති? 'න ඛො අය්‍යෙ කිඤ්චීති.' නො වත රෙ කිඤ්චි පාපි දාසී දිවා උට්ඨාසී'ති කුපිතා අනත්තමනා භාකුටිං අකාසි.

අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා, යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං විමංසෙය්‍යන්ති අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවාතරං උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච: හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙ'ති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? 'න ඛො අය්‍යෙ කිඤ්චී'ති. නො වත රෙ කිඤ්චි පාපි දාසී, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අනත්තමනවාචං නිච්ඡාරෙසි. අථ ඛො භික්ඛවෙ කාළියා දාසියා එතදහොසි: සන්තංයෙව ඛො මෙ අය්‍යා අජ්ඣත්තං කොපං න පාතුකරොති නො අසන්තං, මය්හමෙවෙතෙ කම්මන්තා සුසංවිහිතා යෙන මෙ අය්‍යා සන්තංයෙව අජ්ඣත්තං කොපං න පාතුකරොති, නො අසන්තං. යන්නූනාහං භිය්‍යොසොමත්තාය අය්‍යං වීමංසෙය්‍යන්ති. අථ ඛො භික්ඛවෙ කාළී දාසී දිවාතරංයෙව උට්ඨාසි. අථ ඛො භික්ඛවෙ වෙදෙහිකා ගහපතානි කාළිං දාසිං එතදවොච. හෙ ජෙ කාළීති. 'කිං අය්‍යෙති? කිං ජෙ දිවාතරං උට්ඨාසීති? න ඛො අය්‍යෙ කිඤ්චීති. නො වත රෙ කිඤ්චි පාපි දාසී, දිවාතරං උට්ඨාසීති කුපිතා අනත්තමනා අග්ගළසූචිං ගහෙත්වා සීසෙ පහාරං අදාසි. සීසං වොභින්දි. අථ ඛො භික්ඛවෙ කාළී දාසී භින්නෙන සීසෙන ලොහිතෙන ගළන්තෙන පටිවිස්සකානං උජ්ඣාපෙසි: 'පස්සථය්‍යා සොරතාය කම්මං, පස්සථය්‍යා නිවාතාය කම්මං, පස්සථය්‍යා උපසන්තාය කම්මන්ති.

(කකචූපම සුත්ත - මජ්ඣිමනිකාය)

පදමාලාව

| | | | |
|---|---|---|---|
| **භූතපුබ්බං** | **(කි)** | - | පෙර වූවකි |
| **ඉමිස්සායෙව** | **(සං)** | - | මෙහි ම |
| **සාවත්ථියා** | **(නා)** | - | සැවත්නුවර |
| **කල්‍යාණො** | **(ත)** | - | යහපත් |
| **කිත්තිසද්දො** | **(ස)** | - | කීර්ති ඝෝෂාවක් |
| **අබ්භුග්ගතො** | **(කි)** | - | පැන නැගුණි |
| **සොරතා** | **(ත)** | - | දැමුණු ඉඳුරන් ඇති තැනැත්තියක් |
| **නිවාතා** | **(ත)** | - | සන්සුන් තැනැත්තියක් |
| **උපසන්තා** | **(ත)** | - | උපශාන්ත තැනැත්තියක් |
| **දක්ඛා** | **(ත)** | - | දක්ෂ තැනැත්තියක් |
| **අනලසා** | **(ස)** | - | කම්මැලි නැති තැනැත්තියක් |
| **සුසංවිහිතකම්මන්තා** | **(ස)** | - | පිළිවෙළට කටයුතු කරන |
| **අය්‍යාය** | **(නා)** | - | ආර්යාවගේ |
| **කින්නු** | **(සං)** | - | කිමෙක් ද? |
| **සන්තංයෙව** | **(සං)** | - | ඇත්තා වූ ම |
| **අජ්ඣත්තං** | **(නි)** | - | ඇතුළාන්තයේ වූ |
| **පාතුකරොති** | **(ක්‍රි)** | - | එළිදක්වයි, ප්‍රකට කරයි |
| **උදාහු** | **(නි)** | - | නැතහොත් |
| **අසන්තං** | **(ස)** | - | නැත්තා වූ |
| **මය්හමෙවෙතෙ** | **(සං)** | - | මා විසින් ම මේ |
| **සුසංවිහිතා** | **(ස)** | - | මැනවින් කටයුතු සම්පාදනය කරන්නී |
| **වීමංසෙය්‍යං** | **(ක්‍රි)** | - | විමසන්නෙමි |
| **උට්ඨාසි** | **(ක්‍රි)** | - | නැගිට්ටාය, අවදි වූවා ය |
| **හෙ ජෙ** | **(නි)** | - | ඈ බොල |
| **අනත්තමනා** | **(ස)** | - | නොසතුටු සිත් ඇත්තී |
| **භාකුටිං අකාසි** | **(ක්‍රි)** | - | බැම හැකිලුවා ය |
| **භිය්‍යොසොමත්තාය** | **(නි)** | - | බෙහෝ සෙයින් |
| **දිවාතරං** | **(ත)** | - | වඩා දහවල් වී |
| **වත** | **(නි)** | - | ඒකාන්තයෙන් |
| **රෙ** | **(නි)** | - | කොල, බොල |
| **නිච්ඡාරෙසි** | **(ක්‍රි)** | - | පිටකළාය |
| **අග්ගළසූචිං** | **(නා)** | - | දොරපොල්ල |
| **වොභින්දි** | **(ක්‍රි)** | - | බින්දාය, පැළුවාය |
| **භින්නෙන සීසෙන** | **(නා)** | - | පැළුණු හිසින් |
| **ලොහිතෙන ගළන්තෙන** | **(නා)** | - | ලේ ගලමින් |
| **පටිවිස්සකානං** | **(ස)** | - | අසල්වැසියන්ට |
| **උජ්ඣාපෙසි** | **(ක්‍රි)** | - | කෑ ගැසීය, දොස් නැගීය |
| **පස්සථ** | **(ක්‍රි)** | - | බලවු |

### අභ්‍යාස

01. 'පසසථ අය්‍යා උපසන්තාය කම්මං' ඡේදය සිංහලට නගන්න.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. වෙදෙහිකාය ගහපතානියා දාසී කා නාම අහොසි?
ii. සා කිර දාසී කීදිසා අහොසි?
iii. සා අත්තනො චෙතසා කිං චින්තෙසි?
iv. අත්තනො අය්‍යං වීමංසිතුං සා කිං අකාසි?
v. කුපිතා අනත්තමනා වෙදෙහිකා තං දාසිං කිං අකාසි?

03. පිළිතුරු සපයන්න.

i. බුදුධකාලීන භාරතයේ දාසීන්ගේ ස්වරූපය පිළිබඳ කරුණු 02 ක් ලියන්න.
ii. වේදේහිකාවගේ ඉවසීම පරීක්ෂා කිරීමට දාසිය කළේ කුමක් ද?
iii. ඇතුළාන්ත කෝපය දුරුකිරීමට අනුගමනය කළ යුතු ප්‍රතිපදාව කුමක් ද?
iv. මෙම පාඩමෙන් උගත හැකි ආදර්ශ 03 ක් ලියන්න.
v. නිලීනව (සැඟව) පවත්නා කෙළෙස් හඳුනාගත හැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

### වාක්‍ය රචනය - II

ඉහත පාඩමේ දී කර්තෘ, කර්ම, ක්‍රියා යන මූලිකාංගවලින් සමන්විත වාක්‍යයකට නාම විශේෂණ, ක්‍රියා විශේෂණ, සංඛ්‍යා ශබ්ද ආදිය යොදා ක්‍රම ක්‍රමයෙන් එම වාක්‍ය දිගු කර ගන්නා ආකාරය ඉගෙන ගතිමු. මෙම පාඩමේ දී තුමන්ත ක්‍රියා, කිතක, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා ආදි පද එක්කොට අර්ථවත් හා පරිපූර්ණ වාක්‍යයක් සකසන ආකාරය තවදුරටත් ඉගෙන ගනිමු.

### තුමන්ත ක්‍රියා

'**යන්ට**', '**කරන්ට**' යනාදි අර්ථ ලබාගැනීම සඳහා ධාතුව අගට '**තුං**' '**තවෙ**' යන ප්‍රත්‍යය එක් කොට සාදාගන්නා පද විශේෂය **තුමන්ත ක්‍රියා** පද ලෙස හැඳින්වේ. මේවා ඇතැම් තැනෙක නිපාත ලෙසින් ද හඳුන්වා ඇති කිතක පද විශේෂයකි.

- '**අ**' කාරාන්ත හා '**උ**' කාරාන්ත ධාතු සඳහා ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරෙහි '**ඉ**' කාරයක් ආගම කොට තුමන්ත ක්‍රියා පද සාදා ගනී.

| | | | |
|---|---|---|---|
| උදා:- | පච + ඉ + තුං | පචිතුං | (පිසන්නට) |
| | ඛාද + ඉ + තුං | ඛාදිතුං | (කන්නට) |
| | හර + ඉ + තුං | හරිතුං | (ගෙන යන්නට) |
| | ධාව + ඉ + තුං | ධාවිතුං | (දුවන්නට) |

- 'ආ' කාරාන්ත ධාතුන්ට ඍජුව ම තුමන්ත ප්‍රත්‍යය එක් කොට තුමන්ත ක්‍රියා පද සාදා ගනී.

| | | | |
|---|---|---|---|
| උදා:- | දා + තුං | දාතුං | (දෙන්නට) |
| | පා + තුං | පාතුං | (බොන්නට) |
| | ඨා + තුං | ඨාතුං | (සිටින්නට) |
| | ඤා + තුං | ඤාතුං | (දැන ගන්නට) |

- ඇතැම් ධාතුන්ගේ අන්තයේ ඇති ව්‍යඤ්ජනාක්ෂරයට හා ප්‍රත්‍යයට අනුරූප ලෙසත් අකුරක් ආදේශ කොට තුමන්ත ක්‍රියා පද සාදා ගනී.

| | | | |
|---|---|---|---|
| උදා:- | ගමු + තුං | ගන්තුං, ගන්තුං | (යන්නට) |
| | කර + තුං | කත්තුං | (කරන්නට) |
| | වද + තුං | වත්තුං | (කියන්නට) |
| | භුජ + තුං | භොත්තුං | (අනුභව කරන්නට) |

- ඇතැම් විට ධාතුවේ පූර්ව ස්වරය වෘද්ධි කොට තුමන්ත ක්‍රියා පද සාදා ගනී.

| | | | |
|---|---|---|---|
| උදා:- | න + තුං | නෙතුං | (පමුණුවන්ට) |
| | ජි + තුං | ජෙතුං | (දිනන්නට) |
| | සු + තුං | සොතුං | (අසන්නට) |
| | හු + තුං | හොතුං | (වන්නට) |

මීට ඉහත පාඩමකදී විශේෂණ පද හා උපසර්ග, නිපාත පද යොදාගනිමින් අලංකාරවත් දිගු වාක්‍ය නිර්මාණය කරන්නට උගන්තෙමු. දැන් තුමන්ත ක්‍රියා පද යොදා වාක්‍ය දිගු කොට ලිවීමට පුරුදු වෙමු.

ජනා විහාරං ගච්ඡන්ති.
සජ්ජනා විහාරං ගච්ඡන්ති.
සජ්ජනා විහාරං නිබද්ධං ගච්ඡන්ති.
සජ්ජනා විහාරං ධම්මං සොතුං නිබද්ධං ගච්ඡන්ති.
තස්මිං සමයෙ සජ්ජනා විහාරං ධම්මං **සොතුං** ගච්ඡන්ති.

ඉහත දැක්වෙන ආකාරයට විශේෂණ නිපාත, උපසර්ග පද හා තුමන්ත ක්‍රියා යොදා ගනිමින් වාක්‍ය දිගු කොට ලිවීමට හුරුවන්න.

## පූර්ව ක්‍රියා

අවසාන ක්‍රියාවට පෙර සිදු කොට අවසන් වූ ක්‍රියා පූර්වක්‍රියා ලෙස හැඳින්වේ. පූර්වක්‍රියා සාදාගනුයේ ධාතුවේ අගට **ත්වා, ත්වාන, තූන** යන ප්‍රත්‍යය එක්කර ගැනීමෙනි. **(පුබ්බකාලෙකකත්තුකානං තූන ත්වාන, ත්වා වා)** යනුවෙන් බාලාවතාරයේ මේ බව දැක්වේ. ඇතැම් විට 'ය' ප්‍රත්‍යය එක් කිරීමෙන් ද පූර්වක්‍රියා පද සෑදේ. තනි තනිව කිව යුතු වාක්‍ය කීපයක් පූර්වක්‍රියා පද යෙදීම තුළින් තනි වාක්‍යයකින් පැවසිය හැකි ය. පහත දැක්වෙන වාක්‍ය කිහිපය සහ ඉන් අනතුරුව ඒ ආශ්‍රයෙන් දක්වා ඇති තනි වාක්‍යය දෙස බැලීමෙන් උක්ත අදහස පහසුවෙන් අවබෝධ කොට ගත හැකි ය.

- ධාතුවට පරව ත්වා, ත්වාන, තූන යන ප්‍රත්‍යය එක් කොට පූර්වක්‍රියා පද තනා ගත හැකි ය.

උදාඃ- කර + ත්වා - කත්වා
කර + ත්වාන - කත්වාන
කර + තූන - කත්තූන

- ඇතැම් විට ධාතුවට පූර්වයෙන් උපසර්ගයක් යෙදුණු විට විකල්පයෙන් 'ය' ප්‍රත්‍යය ආදේශ වේ.

උදාඃ- අභි + √භූ + ය - අභිභූය
නි + √කමු + ය - නික්ඛම්ම
ආ + √ගමු + ය - ආගම්ම
උ + √ඨා + ය - උට්ඨාය

පූර්ව ක්‍රියා නිපාත ආදිය ද යොදාගනිමින් වාක්‍ය දිගුකොට ලියන ආකාරය බලන්න.

දාරකො පාඨසාලං ගච්ඡති.
ගුණවා දාරකො පාඨසාලං ගච්ඡති.
අථ ඛො ගුණවා දාරකො තං පාඨසාලං ගච්ඡති.
අථ ඛො ගුණවා දාරකො අක්ඛරානි උග්ගණ්හිතුං පාඨසාලං ගච්ඡති.
අථ ඛො ගුණවා දාරකො පාතොව **උට්ඨාය** පාතරාසං **භුඤ්ජිත්වා** අක්ඛරානි උග්ගණ්හිතුං සහසා පාඨසාලං ගච්ඡති.

**අභ්‍යාස**

01. සිංහලට නගන්න.

i. සො කාලස්සෙව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා දන්තකට්ඨං දාතබ්බං, ආසනං පඤ්ඤාපෙතබ්බං හොති.
ii. උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං. පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං හොති.
iii. සචෙ උපජ්ඣායො ජනතාසරං පවිසිතුකාමො හොති චුණ්ණං සනෙන තබ්බං හොති.
iv. පතිකුලෙ වසන්තියා නාම අන්තො අග්ගි බහි න නීහරිතබ්බො. බහි අග්ගි අන්තො න පවෙසෙතබ්බො
v. ඛජ්ජභොජ්ජලෙය්‍යපෙය්‍යවසෙන චතුබ්බිධා හොන්ති මනුස්සානං ආහාරා.

02. පහත දැක්වෙන වාක්‍ය නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ යොදා දිගු කොට ලියන්න.
i. බාළකො ගාමං ගච්ඡති.
ii. වාණිජා භණ්ඩානි වික්කිණන්ති.
iii. පුරිසො විහාරං ගච්ඡති.
iv. කස්සකා ඛෙත්තං කසන්ති.
v. මයං ධම්මං සුණාම.

03. පහත දැක්වෙන වාක්‍ය නිපාත හා උපසර්ග පද ද යොදා ගනිමින් දිගු කොට ලියන්න.
i. භික්ඛු පිණ්ඩාය පාවිසි.
ii. චොරා අස්සෙ චොරෙන්ති.
iii. දාරිකා විහාරං ගච්ජති.
iv. භගවා ධම්මං දෙසෙසි.
v. පුරිසා අස්සෙ කිණන්ති.

04. පහත දැක්වෙන වාක්‍ය තුමන්ත ක්‍රියා හා පූර්ව ක්‍රියා ද යොදමින් දිගුකොට ලියන්න
i. මාතා භත්තං පචි.
ii. පිතා නගරං ගච්ඡති.
iii. දාසා ගොණෙ හරන්ති.
iv. බාලකො පොත්ථකං පඨති.
v. බාලිකා දාරූණි ආහරති.